# සංක්ෂේපය

ලෝකයේ අන් රටවල මෙන් ම අප රටෙහි ද අධ්‍යාපන ක්‍රියාවලිය නිරන්තරයෙන් වෙනස්වීම්වලට භාජනය වේ. සමාජ ප්‍රගතිය උදෙසා වැදගත් කාර්යභාරයක් අධ්‍යාපන ක්‍රියාවලියට පැවරී ඇත. මෙහි දී අධ්‍යාපනය යළි යළි සකස්වීම, ප්‍රතිසංස්කරණ එකතුවීම බහුල ව දැකිය හැකිය. ආර්ථික, සාමාජික හා දේශපාලනමය අවශ්‍යතා මත නව මං ඔස්සේ සමාජය හැඩ ගැස්වීම අරමුණු කොටගන්නා නව විෂය මේ ප්‍රතිසංස්කරණ තුළින් පාසල් විෂය මාලාවට එක් වේ. සමහරවිට කලක් පැවතුණු විෂය ඉවත් කෙරේ. ප්‍රතිසංවිධානය වී යළිත් එකතු වේ. පරිසර අධ්‍යයනය මෙලෙස නවතම විෂයයක් ලෙස පාසල් විෂය මාලාවට 6 වන ශ්‍රේණිය සඳහා 1998 දී එක් වූ එක් විෂයයකි. ස්වාභාවික පරිසරය විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින්ද, සමාජීය පරිසරය සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින්ද, නිර්මිත පරිසරය තාක්‍ෂණවේදී දෘෂ්ටි කෝණයකින්ද විමසා බැලීම සඳහා සිසුන් යොමු කිරීම මෙම විෂයය හැදෑරීමේදී විශේෂයෙන් බලාපොරොත්තු වේ.

සිසුන්ට මෙන්ම ගුරුභවතුන්ට ද නැවුම් වූ පරිසර අධ්‍යයන විෂයයේ අපේක්ෂිත පුළුල් අරමුණු ඉටුකර ගැනීමේ දී, පරිසර අධ්‍යයන විෂයය ඉගැන්වීමේ යෙදී සිටින ගුරුභවතුන් මුහුණදෙන ගැටලු හඳුනා ගැනීමත්, එලෙස හඳුනා ගන්නා ගැටලුවලට විසඳුම් ඉදිරිපත් කිරීමත් අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. මෙහි දී හඳුනා ගනු ලබන ගැටලු පාසල් වර්ගය මත හෝ ගුරුභවතාගේ සුදුසුකම්, පළපුරුද්ද, පුහුණුව හා ස්ත්‍රී පුරුෂ භාවය මත රඳා පවතී දැයි සොයා බැලීම ද අධ්‍යයනයේ අරමුණක් විය.

බස්නාහිර පළාතේ, ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය පදනම් කරගෙන අධ්‍යයනය සිදු කරන ලද අතර, සසම්භාවී ක්‍රමයට තෝරාගත්, පරිසර අධ්‍යයනය උගන්වන, ගුරු භවතුන් 35 දෙනෙකුගේ සමන්විත, නියැදියකට යොමු කරන ලද මූලික ව දත්ත එක්රැස් කරන ලදී. ඊට අමතරව, සසම්භාවීව තෝරාගත් ගුරු භවතුන් 11 දෙනෙකුගෙන් හා කලාපයේ ගුරු උපදේශක භවතුන් දෙදෙනෙකුගෙන් සම්මුඛ සාකච්ඡා මගින් දත්ත ලබාගන්නා ලදී.

මෙහි දී ප්‍රධාන ආකාර තුනක ගැටලු හඳුනා ගන්නා ලදී. එනම් පාසල් පරිසරය ආශ්‍රිත, ගුරුභවතුන් ආශ්‍රිත හා සිසුන් ආශ්‍රිත ගැටලුයි. ප්‍රධානම ගැටලුව ලෙස භෞතික සම්පත් ඌණතාව හඳුනා ගන්නා ලදී. ඒ හේතුවෙන්, ක්‍රියාකාරකම්වලට උචිත, ශිෂ්‍යයාට ප්‍රියජනක පන්ති කාමරයක් ගොඩනගා ගැනීමට නොහැකි වී ඇත. එමෙන් ම, අදාළ ක්‍රියාකාරකම් කිරීමට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය නොමැතිවීමත්, මහත් දුෂ්කරතා මැද සකස් කරනු ලබන ඉගෙනුම් ආධාරක ප්‍රදර්ශනය කිරීමටත්, ගබඩා කර තබා ගැනීමටත් ස්ථාන පාසලේ නොමැතිවීමත් හඳුනාගත් බරපතල

ගැටලු විය. අවශ්‍ය මානව සම්පත් (ගුරු භවතුන්) ඌනතාවද හඳුනාගත් ගැටලුවක් විය.

ගුරුභවතුන් ආශ්‍රිතව හඳුනාගත් ප්‍රධානම ගැටලුව වූයේ, අදාළ විෂයයට නිසි පුහුණුවක් ගුරුභවතුනට නොලැබීමයි. විෂය නිර්දේශ, ගුරු අත්පොත් ආදිය කලට වේලාවට නොලැබීමත් ගැටලුවක් විය. සිසුන් ආශ්‍රිතව හඳුනාගත් ගැටලු වූයේ සිසුන්ගේ විවිධත්වයත්, ඔවුන් ඉගෙනීමට යොමු නොවී තිබීමත්ය. සිසුන්ගේ ආර්ථික හා සමාජ ප්‍රශ්න නිසා ඇතිවන ගැටලුත් දෙමාපියන්ගේ සහයෝගය නොලැබීම නිසා ඇතිවන ගැටලුත් කැපී පෙනුනි. ඉහත කිසිදු ගැටලුවක් පාසල් වර්ගය මත හෝ ගුරුභවතාගේ සුදුසුකම්, පළපුරුද්ද, පුහුණුව හා ස්ත්‍රී පුරුෂ භාවය මත හෝ රඳා නොපැවතිනි. එනම් සෑම පාසලකම සෑම ගුරු භවතෙකුටම පරිසර අධ්‍යයනය ඉගැන්වීමේදී එකම ආකාරයේ ගැටලුවලට මුහුණ දීමට සිදුවේ.

අධ්‍යයනයේදී හඳුනාගත් ගැටලුවලට විසඳුම් ලෙස සෑම පාසලකටම අව සෑම පාසලකටම අවශ්‍ය මූලික සම්පත් ලබාදීමත්, අඛණ්ඩව ගුරුභවතුන් පුහුණු කිරීමත්, ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා සේවාස්ථ සැසි හා පුහුණු පාඨමාලා නිතර පැවැත්වීමත්, ඔවුනට ගුරු අත්පොත් හා විෂය නිර්දේශ කලට වේලාවට ලබාදීමත් අවශ්‍ය වේ. ඊට අමතරව, දෙමාපියන් සුදුසු පරිදි දැනුවත් කිරීමත්, සිසුන්ට ප්‍රියජනක ලෙස පන්ති කාමර සැකසීමත්, වෙනස් ක්‍රියාකාරකම් මගින් වැඩි ආයාසයකින් තොරව අධ්‍යාපනය ලබා ගැනීමට සිසුන්ට උපකාරවීමත් අවශ්‍යය. එමගින් පරිසර අධ්‍යයන විෂයයේ අපේක්ෂිත පුළුල් අරමුණු කරා ගමන් කළ හැකිය.

මෙම අධ්‍යයනය ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයට සීමාවූ අතර, ගුරු භවතුන්ගේ සහ ගුරු උපදේශක භවතුන්ගේ අදහස් පමණක් නියෝජනය වේ. දෙමාපියන්ගේ හා සිසුන්ගේද අදහස් සැලකිල්ලට ගැනීමෙන් වඩා ඵලදායී නිගමනවලට එළඹිය හැකිවනු ඇත.